ආරක්ෂක සේවා සැපයීම සඳහා ලංසු කැඳවීම

ලංකා - ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
(වෘත්තීය අධ්‍යාපන අංශය)
ප්‍රසම්පාදන අංකය: CGT/TB/01/31/2026

ලංකා - ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය, නො 582, ගාලු පාර (ගල්කිස්ස), මොරටුව ආයතනය පරිශ්‍රය, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ අත්තිඩිය ශිෂ්‍ය නේවාසිකාගාරය, ගල්කිස්ස, පීරිස් මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂක විදුහල්පති නිළ නිවස, කොළඹ 08, බොරැල්ල, රුහුණු කලා මාවතේ පිහිටි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට අයත් මධ්‍යස්ථානය සහ ආණමඩුව, තම්මැන්නාගම, ගම්උදාව භූමියේ පිහිටි ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ කලාපීය මධ්‍යස්ථානය වෙත අවශ්‍ය ආරක්ෂක සේවාවන් ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි සහතිකලත්, පළපුරුදු සහ පිළිගත් ආරක්ෂක සේවා සපයන ආයතනවලින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

1. සේවයේ විෂය පථය

- ආයතනික පරිශ්‍රයේ දේපොළ , කාර්ය මණ්ඩලය සහ ආධුනිකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
- දවසේ පැය 24 පුරාම (කණ්ඩායම් ක්‍රමයට) සුදුසුකම් ලත් ආරක්ෂක නිලධාරීන් යෙදවීම.
- ආයතනයට ඇතුළුවන සහ පිටවන වාහන හා පුද්ගලයින් පරීක්ෂා කිරීම සහ වාර්තා තබා ගැනීම.
- ආරක්ෂක කාර්යය මණ්ඩලයේ සේවා මුර පැය 12කට සීමා විය යුතු වන අතර දිනකට සේවා මුර 02ක් පවත්වා ගෙන යා යුතුය.

2. ලංසු ලියවිලි ලබා ගැනීම

- ලංසු ලියවිලි ආයතනීය ගිණුම් කාර්යාලය වෙතින් 2026.11.11 දින සිට 2026.11.23 දින දක්වා පෙ.ව. 8.30 සිට ප.ව. 3.00 අතර කාලය තුළ ලබාගත හැක.
- ලංසු ලියවිලි ගාස්තුව ලෙස ආපසු ගෙවනු නොලබන රුපියල් 1,000.00 ක මුදලක් ගිණුම් කාර්යාලය වෙත ගෙවා රිසිට්පත ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.

3. ලංසු සුරක්ෂිතභාවය (Bid Security)

- ලංසු සමඟ රුපියල් හාර ලක්ෂයක් (රු.400,000.00 ක මුදලක් ලංසු සුරක්ෂණයක් නියමිත ආකෘතියට අනුව ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවක් මඟින් නිකුත් කරන ලද ඇපකරයක් මඟින් හෝ අදාල මුදල ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ගිණුම් කාර්යාලය වෙත ගෙවීමෙන් ලද රිසිට්පතෙහි මුල් පිටපත ලංසු ලියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. එහි වලංගු කාලය 2027.02.10 දක්වා විය යුතුය.

4. ලංසු භාර දීම සහ විවෘත කිරීම

- සම්පූර්ණ කරන ලද ලංසු "ආරක්ෂක සේවය සැපයීම - 2027" ලෙස කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කර, ලියාපදිංචි තැපෑලෙන් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය නො 582, ගාලු පාර (ගල්කිස්ස), මොරටුව වෙත එවිය යුතුය. එසේත් නැතහොත් අදාළ ආයතනයේ ගිණුම් කාර්යාලයේහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බැහැළිය හැක.
- ලංසු භාරගන්නා අවසන් දිනය සහ වේලාව 2026.11.25 **දින ප.ව. 2.00 දක්වා වේ.** ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
- ප්‍රමාද වී ලැබෙන ලංසුපත් භාර ගනු නොලැබේ.

5. වැඩිදුර විස්තර

- මෙම ප්‍රසම්පාදන කාර්යය සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය නම්, **011-2605625 / 011-2605535** මඟින් ලංකා - ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ගණකාධිකාරී අමතන්න

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
නො 582, ගාලු පාර (ගල්කිස්ස), මොරටුව

2026.11.11